නිර්මාණකරුවෙකුගේ මතක සටහන්

# පෙරහැරයි - බොරු කකුලයි



සනත් පියසේන

16

බලන්න පොඩිපුතේ පෙරහැරක් ද කොහේ ද, මල් බයිසිකල් එනව''දරකෝටු මිටියක් හිස මත තබාගෙන විත් මිදුල මැදට අතැරිය ආච්චි පැවසුවේ මා ආතාගේ ඇඳ අසල බිම වාඩිවී පුච්චපු දොඹගෙඩියක් කොහොඹ තෙලින් සිමෙන්ති පොළොවේ උරච්චි කරමින් සිටින විට ය.

කකුල් දියමැඩියා කෑමෙන් අපේ ගමේ බොහෝ ළමයින් මෙන්ම වැඩිහිටි උදවියද පීඩා වින්දහ. දියමැඩියා කෑම යනුවෙන් හඳුන්වන කකුලේ ඇඟිලි කරු වනවීම අපට හුරු පුරුදු රෝගයකි. අප හැම කෙනෙක් ම එයට කරනු ලබන බෙහෙත වන්නේ දොඹ ගෙඩියක් පුළුස්සා මදය කොහොඹ තෙල් සමග බිම අතුල්ලා උරච්චි කොට ඇඟිලි කරු අතර තැවරීමයි. එයින් ම එම රෝගය වේළී යයි. මෙම රෝගය වැළඳීමට ප්‍රධාන හේතුව වශයෙන් සිහිපත් කළ හැකි වන්නේ මඩ කඩිතිවල නැටීම අපේ පුරුද්දක් වීමත්, වර්ෂාපතනයෙන් අඩුවක් නොවූ කළුතර දිස්ත්‍රික්කයේ ගමක් වන මෙම ගමේද දිය කඩිති වලින් අඩුවක් නොවූ නිසාත්, කිසිම විටක දියකඩිත්තකින් බේරී යාමට පුංචි අප උනන්දු නොවී ඒ තුළ බැස යාමට ආසා කළ නිසාත් ය. එවකට කිසි ම ළමයෙකු හෝ වැඩිහිටියකු විශේෂ ගමනක් බිමනකට හැරෙන්නට සෙරෙප්පු, සපත්තු පාවිච්චි නො කළහ. පාසල් ගුරුවර ගුරුවරියන් වැඩි දෙනෙකු ද පාවහන් නො දැමූහ. මෝටර් සයිකලයේ එන ඉංගිරිසි මහත්තයා පමණක් දිග කලිසම් ඇඳ සපත්තු පැළඳ සිටියේ ය.

ආච්චිගේ පණිවුඩය ඇසූ වහා ම උරච්චි කරමින් සිටි දොඹගෙඩිය එතැන ම තබා ජංගියේ පිටුපස අත්දෙක පිස දමාගෙන උඩහ කඩේ පැත්තට ගියේ පෙරහැරක ලකුණු දැකීමට ය. මාටින් බාප්පලාගේ ගෙයට එහායින් කන්ද මුදුනෙන් මල් බයිසිකල්වල මුදුන පෙනී ක්‍රමයෙන් ඉහළට එන දර්ශනය පෙනේ. එසේ පැමිණි මල් බයිසිකල් කිහිපයක් ම පහළ තොටුපළ පැත්තට ගියහ. බෙරයක් කරේ එල්ලාගත් අයෙක් සහ තවත් කිහිප දෙනෙක් පහළ පැත්තට ඉක්මන් ගමනින් යති. ඔවුහු කොට්ට උරවල දමාගත් කිසිවක් අතින් එල්ලාගෙන සහ සමහර කෙනෙක් කර මත ද තබාගෙන ගියහ. ඒවායේ ඇත්තේ නැටුම් සඳහා අවශ්‍ය වන ඇඳුම් සහ වෙස්මුහුණු ආදිය බව අපි දනිමු. බොහෝ දෑ පටවාගත් කරත්තයක් චන්ද්‍රදාසලාගේ කඩය ළඟ නවත්වා පල්ලම් පොල්ල බුරුල් කොට පහළ පැත්තට ගියේ ය. තවත් නොයෙකුත් දෙනා බයිසිකල්වලින් සහ පයින් ඉක්මන් ගමනින් යති. මම ද පියතිලක බාප්පා සහ චන්ද්‍රදාස ද සමග පහල පැත්තට ගියෙමි.

සෙනෙවිරත්න මුදලාලිගේ කඩයට මෙහායින් තිබුණු හිස් ඉඩම් කොටසක සියළු ම දෙනා නැවතී සිටියහ. සමහරක් අය නැපෝසිංඤෝ මුදලාලි ගේ ගෙමිදුලේ ය. දැන් පෙරහැර සඳහා සියලු ම දෙනා ලක ලැහැස්ති වෙති.

එක තැනක සමහරු නැටුම් සඳහා ඇඳුම් අඳිති. ඇඳුම් අඳින ගමන් ම නැටුමක පෙරහුරුවක් කරන අය ද වූහ. තැනක කෙනෙක් බෙර ගසන අතර ඒ අනුව නටන අයෙක් බඩ පිනුමක් ද ගසා, බෙරය ගැසූ කෙනාට ආචාර කරමින් බොහෝ මහේශාක්‍ය විලාශයෙන් එහෙට මෙහෙට යන්නේ අනිත් අයට පෙනෙන්නට ය. ලී කෙළි සෙල්ලම් කිරීමට පැමිණි ළමයි තැනක පෙරහුරුවක් ලබති. ලී එකිනෙකට වැදෙන ශබ්දය නැගෙන දෙස සැම දෙනා ම බලා සිටින්නේ දැත් දෙපය ක්‍රියාත්මක වන ලතාවට අනුව වැදෙන ලී කෙළි ශබ්දයේ ඇති ක්‍රමානුකූලතාවය ගැන විශ්මයෙනි. ලී කැබලි දෙකක් එකට වැදීමෙන් මතුවන ශබ්දය ගොරහැඩි ශබ්දයක් ලෙස සිතුණත්, කීපයක් කිසියම් රිද්මයකට එකට වදින ශබ්දය කොතරම් නම් මිහිරි ද?

මේ අතරතුර භූමිතෙල් සහ අළු මිශ්‍ර කරමින් සකසන මිශ්‍රණයකි. එය කුමක් සඳහා දැයි ලොකු අයෙකුගෙන් විමසුවත් ලැබෙන උත්තරය වනුයේ "ටිකක් රෑවෙල බලහල්ලකො, පෙරහැර යනකොට." යන්න යි. විශාල බාල්දියකට අළු පුරවා ඒ මත භූමිතෙල් හලා කරන ලද මිශ්‍රණය කිසියම් පදමකට එනතුරු අනා පසෙකින් තැබූ දෙදෙනෙක් කඩදාසි කැබලිවලින් අත් පිස දා ගත්හ.

බොරු කකුල් බඳින පුද්ගලයා තරමක් උස තාප්පයක වාඩි වී සිටින අතර දෙදෙනෙක් ඔහුගේ දෙපාවල බොරුකකුල් බඳිති. බොරු කකුල මුදුනින්, කකුලේ යට කොටස නියම ලෙස තැබීමට හැකි වන සේ කපා ඇත. ඒ මත කකුල තැබූ විට දනහිස ළඟට පමණ වනතුරු වෙළන්නේ ඉතාමත් ක්‍රමානුකූල ව ය. බොරු කකුල බැඳ අවසානයේ වෙනත් කෙනෙකුගෙන් බුලත්විටක් ඉල්ලාගෙන කෑ බොරු කකුල් කාරයා ඇඟිලි දෙක කටට තබා තාප්පයෙන් පිටට රතුපාටින් කෙළ ගසා නැගිට්ටේ ය. ඔහු දැන් ඉතාමත් උස ය. අපි ඔහු වටා යමින් ඔහු කරන විහිළු තහළු අසා උඩ පනිමින් සිනාසෙන්නෙමු. සමහර විටක ඔහු නටයි. එහෙට මෙහෙට ඇවිදියි. බොහෝ නැට්ටුවන් ලකලැහැස්ති වී තැන තැන සිටිය ද බොරුකකුල් බැඳගත් ඔහුට එක තැනක නැවතී සිටීමට පුළුවන්කමක් නැත.

''ඔතන ඉඳල පෙරහැර බලන්න බෑ . වරෙන් යන්න පුතේ ගෙදර යන්න.''යි ආතා මගේ අතින් අල්ලාගෙන ගෙදරට කැඳවාගෙන ගියේ මගේ අකමැත්ත පිට ය.

මා පෙරහැර එනතුරු ඉස්පාසුවක් නැතුව පහල පැත්ත බලාගෙන සිටියේ ගෙයි පිළේ වාඩි වී ගෙන ය.

දැන් බෙර ශබ්දය ඇසෙයි. ඉස්කෝලේ කොස්ගස ළඟින් මෑත් වී ඉදිරියට එන මල්බයිසිකල්කරුවන් පේළිය එන්නේ පාරපුරා වංගු ගසමිනි. ගිනිබෝලකරුවෙක් ගිනිබෝලයක් කරකවමින් ඉදිරියට එයි. ගිනිබෝලකරුවාට පිටුපසින් නැටුම් දර්ශන ය. සැම නැට්ටුවකු ම නටන්නේ ගසන එක ම බෙර ශබ්දයට යි. ලී කෙළි නැටුම්, කුලු නැටුම් අතර ජසයා සහ ලෙන්චිනා ද හිස සොලව සොලවා නටමින් එති. මත්පැනින් සප්පායම් වුණු සමහරු පෙරහැරේ තැනින් තැන බෙර පදයට නටමින් එන අතර කෙනෙකු කකුල් පැටලී ඇද වැටෙන දර්ශන ද නැතුවා නොවේ. ඒ දෙස බලා බොහෝ දෙනා කොක් හඬ ලා සිනාසෙති.

ලොකු කොළපත් දෙකක් හිසට සහ තල්ලට යටින් තබා බැඳගෙන ඒ තුළින් එළියට එන ලී පටි දෙකක් දල දෙකක් සේ වරින් වර පෙන්නමින් එන වෙස් මූණ පැළඳගත් නැට්ටුවාද, තවත් වෙස් මුහුණු බැඳ ගත් නැට්ටුවෝද පාර දෙපස බලා සිටින අයගේ ඇඟට කඩා පනිති. එවිට නරඹමින් සිටින අය පසුපසට පැන හිනාවෙති.

බටවලින් තැනූ අශ්වයින් දෙදෙනෙක් උඩ විසිවෙමින් පැන පැන ඉදිරියට එනු පෙනේ. අශ්වයින්ගේ හැඩය ගත් බටගස් වලින් තැනූ කූඩුව වටා සුදුපාට රෙදි ඔතා තැනූ අශ්වයින් ඔසවාගෙන එන අශ්වාරෝහකයා අශ්ව ගමන් විලාසය පෙන්වනවා පමණක් නොව හේසාරව ද නගයි. මීට ඉහත තැනක සඳහන් කළ භූමිතෙල් සහ අළු මිශ්‍රණය පිරවූ බාල්දිය මැදින් පොල්ලක් දමා දෙදෙනෙකු විසින් ඔසවාගෙන එන අතර වෙනත් අයෙක් පොල්කටු හැන්දකින් මිශ්‍රණයෙන් පිඩක් ගෙන පාරේ පැත්තකට වෙන්න අඩි පහෙන් පහට වාගේ බිම හළයි. තවත් කෙනෙක් පන්දමක් එම අළු පිඩුවලට කිට්ටු කරයි. එවිට අළුගොඩ වහාම ගිනි ගනී. ඉස්කෝලේ ළඟ කොස්ගහයට සිට ඇවිළෙන ගිනි මැළ පේළිය ඉතාමත් චමත්කාරජනක අයුරින් අපේ ගෙදරට පෙනේ.

අප විශේෂයෙන් බලාපොරොත්තුව සිටි බොරුකකුල්කාරයා ඉස්කෝලයෙන් මෙහාට මෑත්වන විට අත් දෙකෙන් තට්ටම් දෙකට තට්ටු කරමින් උඩ පැනපැන දඟලන මා දුටු ආච්චි "මූට හැදිල තියෙන කඩිකුලප්පුවක්" ය යි. කීවා ය. එළිය සහ කළුවර අතරින් පෙනෙන බොරු කකුල් කාරයාගේ දර්ශනයෙන් නෙත් ඉවත් කර ගැනීමට මට නොහැකි ය.

''පුතේ බලහන්කො යකෝ පැද්දි පැද්දි එනහැටි'' පියතිලක බාප්පාගේ උනන්දුවද මගේ උනන්දුවට පොඩි නැත. පාරේ දෙපැත්තට යමින් බොහෝ තේජවන්ත විලාශයෙන් පැමිණෙන බොරුකකුල්කාරයා චන්ද්‍රදාසලා ගේ කඩය ළඟ ටිකක් වැඩිපුර නැටුවේ ය. නැවත ගමන ආරම්භ කොට ඇතින් ඇතින් ලතාවකට අඩිය තබමින් එන ඔහු දෙස උඩ බලා බලාසිට අපේ ගෙය පසුවන විට උඩහ කඩේ ළඟට ඔහු පසුපස ගියෙමු.

ඔසවමින්, පහත් කරමින් ශබ්ද නගමින් ගෙන එන පින් කැටයට දැමීම සඳහා ආතා මට දුන් සතපහ එයට දමා වැන්දෙමි.

පෙරහැර අවසන් ව සෑහෙන වේලාවක් යනතුරු ම අවදිව සිට නින්දට ගියත්, පෙරහැරේ හේවිසි ශබ්දයත්, සාදු නාදයත් සිහිනයෙන් වාගේ ඇසෙයි. බොරුකකුල් කාරයාගේ දර්ශනය විටින්විට සිහිනෙන් ද දුටුවෙමි.

පසුවදා උදෑසන පියතිලක බාප්පාත්, උඩහ සිරිපාල අයියාත් අපේ ගේ ඉදිරිපිට, මහත්තයා මාමා සාදාගෙන යන ගෙයි මිදුලේ සිට මට අතවනා කතා කළහ.

''ඒයි පුතේ අපි වැඩක් කරමුද?'' පියතිලක බාප්පා ඉස්සරවිය.

''මොකක්ද?''

''බොරුකකුල් යං'' ඒ සිරිපාලගේ කටහඬය.

''මරු හා යං'' ඔවුනට වඩා මගේ කටහඬ ඉස්සර වුණා මෙන් ය.

''එහෙනං උඹ ටිකෝනිස් මාමා කිරි කපන්න ගියා ම සිරිපාලලගේ ගේ ළඟට වරෙන්. අපි එතන ඉන්නවා''

''හා'' යි මා කීවේ රහසිනි.

මා එනතුරු පියතිලක බාප්පාත්, සිරිපාලත්, අමරදාස අයියාත් මාටින් බාප්පලාගේ ගේ ඉදිරිපිට පාරේ බලා සිටිනවා දුටුවේ උඩහ කඩේ ළඟට එන විටම ය. මා දුටු ඔවුහු විගස ඉක්මණින් එන ලෙස අතින් සංඥා කළහ.

මන්නයක්, රෙදිපටි, පාන්කඩ ටිකක් සහ හණලණු ටිකක් සිරිපාල අතේ විය. වේලාව උදේ අටහමාරට පමණ වන්නට ඇත. අමරදාස අයියා අතේ තිබූ ජම්බල බිකකින් අපට රේණු කැබැල්ල බැගින් බෙදුවේ ය. අප සිව් දෙනා තව ටිකක් උඩහට ගොස් බණ්ඩාර උන්නැහේලා ගේ නිවස ඉදිරිපිටින් රබර් කට්ටිය මැදින් පහළට බැස කුඹුරු යායට පිවිසුනෙමු.

කුඹුර මැදින් ගලා යන ඇළට බැසගත් අපි ඇළ දිගේ උඩහට ටික දුරක් ගොස් වැලිතලාවක නතර වීමු.

සිරිපාල ඕනෑම නිර්මාණයක් කිරීමට හපනෙකු මෙන් ම, ඕනෑම දෙයකට කාටත් කලින් ඉදිරිපත් වන දක්ෂයෙකි. ඔහු ඇඳ සිටි සරම කැහැපට ගසාගෙන මන්නය ද අතට ගෙන ඇළ අයිනේ තරමක වැලි ආත්තා ගස් දෙකක් කපා අඩි තුනක පමණ උස වනසේ කෙටිකර පට්ටය ඇර බොරු කකුල් දෙක සකස් කළේ ය. කැපූ ලීයෙන් අඩියක් පමණ පහතට වනසේ දෙකට මැදින් පලා පැත්තක් කපා දමා කකුල හොඳින් සිටින සේ සකස් කළේ ය. බොරුකකුල් දෙක සකස් කොට අවසන් වී මුලින් ම බැඳ ගැනීමට ඉදිරිපත් වූයේ ද සිරිපාල ය. ඇල කණ්ඩියේ වාඩිවූවාට පසු රෙදි පාන්කඩ ද යොදා බොරු කකුල තබා බැන්දේ අනිත් අය කීප දෙනා ම එකතු වීමෙනි.

බොරුකකුල් දෙක බැන්දාට පසු සිරිපාල නැගිටුවා දෙපසින් දෙදෙනෙක් අල්ලාගෙන යාමට වත්තන් කෙරුවත් ඔවුන් ද පෙරළාගෙන සිරිපාල වැල්ල මතට ඇද වැටුණේ ය. එහෙත් කිසිදු වේදනාවක් හෝ රිදීමක් ඔහුගේ මුවින් පළ නො වුණි. නැවත බොහෝ අමාරුවෙන් ඔහු තඩලා කෙළින් කොට අඩි කීපයක් ඉදිරියට ගියත් නැවත වැටුණි. වැටෙන එකද, නැවත තඩලා කෙළින් කර ඇවිද්දවන එකද අපට විනෝද ක්‍රීඩාවක් බවට පත්විය.

සිරිපාලගේ කකුල්වලින් බොරු කකුල් දෙක ගැලවූ පසු ඔහු නැවත මන්නයද අතට ගෙන කැලෑ රොදට රිංගා රට ගොරකා ගෙඩි කිහිපයක් ද රැගෙන ආපසු ආවේ ය. දැන් දහවල් වීමට ද ආසන්න බැවින් කුස ගින්නද තරමකට දැනෙමින් තිබිණ. අප සිව් දෙනා ම රටගොරකා හිරල කෑවෙමු.

දෙදෙනෙකු බොරු කකුල් පුහුණු වීම කළ පසු පැමිණියේ මගේ වාරය යි. මම ද ඇල කණ්ඩිය උඩින් වාඩි වී කකුල දිගු කරගෙන සිටියේ බොරු කකුල බැඳීමට ය. අමරදාසත් සිරිපාලත් දෙදෙනා මගේ එක කකුලක බොරු කකුලක් බැඳ අවසන් වූවා පමණී

''ඔන්න බොල ටිකෝනිස් මාම'' පියතිලක බාප්පා එකවිට ම කියා දුවන්නට පටන් ගත්තේ ය. බෙල්ල හරවා පිටුපස කන්ද දෙස බැලූ විට ආතා පහළට බසියි. අමරදාසත් සිරිපාලත් ඇළ දිගේ උඩහට දුවගෙන ගොස් හැංගෙන්නට ඇත.

මට අඬනවාට වඩා කරන්නට දෙයක් නැත. ආතා මා ළඟට ඔරවාගෙන පැමිණ ඉනේ පිටුපස ගසා ගෙනැවිත් තිබුණු වේවැළ වේගයෙන් ඇද මට පහර කිහිපයක් ගැසුවේ මහා කේන්තියෙනි.

''කාල ගෙදෙට්ට වෙලා ඉන්න බැරුව අඩුකඩා ගන්න හදනවද බූරුවෝ''. කියමින් ආතා මට තවත් පහර කිහිපයක් ගසා ''කෝ අනිත් එවුන්'' යනුවෙන් කියමින් වටපිට බලා නැවත මා දෙස බලා වේගවත් පහරක් ගසන්නට අත එසවූවාද ඒ පහර මගේ ඇඟට පහත් වූයේ නැත. පහත් වුණු වේවැළ ඇල කණ්ඩිය මතට අතහැර මා ළඟින් වාඩි වී මගේ කකුල බැඳ තිබූ හණලණුපටවල් ආතාගේ හරක් අං මිට ගැසූ පිහියෙන් කපා දමා මගේ කකුල නිදහස් කළේ ය.

''යං පුතේ ගෙදර'' යනුවෙන් පැවසූ ආතා මගේ උරහිසින් අල්ලා මා නැගිටුවා ඇගේ තැවරී තිබූ වැලි පිස දැමුවේ ය.

බිම වැටී තිබූ සරම අතට ගත් මම දුවන්නට පටන්ගෙන ගේ ළඟට ගොස් සරම ඇඳ ගතිමි.